ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha ගම්පහ අධ්‍යාපන කලාපය Ga

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

**දෙවන වාර ඇගයීම - 2025**
**Second Term Evaluation - 2025**

| ශ්‍රේණිය Grade | 13 | විෂයය Subject | ලංකා ඉතිහාසය - 1 | කාලය Time | පැය 03 |
|---|---|---|---|---|---|

නම/NAME:-.......................................................................................................

සැලකිය යුතුයි.

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල,දී ඇති (1),(2),(3),(4) ,(5)යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් සුදුසු පිළිතුර තෝරා ගන්න.

---

අංක 1 සිට 10 දක්වා එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත.ඒවා අතුරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැලපේ.එම නොගැලපෙන නාමය කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන් තුළ ලියන්න.

1) 1.මහාතිත්ථ 2. ගෝකණ්ණ 3.කම්මල්තොට 4.දඹකොළපටුන 5.මාගම (……)

2) 1.බෙරගල 2.ඉබ්බන්කටුව 3.පොම්පරිප්පුව 4.පොතාන 5.උඩරංචාමඩම (……)

3) 1.මහාවංශය 2.දීපවංශය 3.බෝධිවංශය 4.ථූපවංශය 5.රසුවංශය (……..)

4) 1අභයගිරිය 2.ජේතවනාරාමය 3.මහාවිහාරය 4.ථූපාරාමය 5.ගඩලාදෙණිවිහාරය (…......)

5) 1.අසේල 2.ලජ්ජතිස්ස 3.චුල්ලත්තන 4.ඛල්ලාටනාග 5.වට්ටගාමිනි අභය (…….)

6) 1.ප්ලිනි 2.චෙංහෝ 3. මෙගස්තිනීස් 4.කොස්මස් 5.ඔනෙසික්‍රිටස් (…….)

7) 1.රවිදේව 2.නන්දිමිත්‍ර 3.වේළුසුමන 4.සුරනිමල 5.ඵුස්සදේව (…….)

8) 1.වලවාමුඛ 2.චේතියා 3.කම්මාරදේව 4.කාලවේල 5.චිත්තරාජ (…….)

9) 1.මතුරට 2.උඩුනුවර 3.යටිනුවර 4. දුම්බර 5.හේවාහැට (…….)

10) 1.චේතියගිරි 2.බෝධිඝර 3.උපෝසථඝර 4.ප්‍රතිමාඝර 5.සූතිඝර (…….)

අංක 11 සිට 15 දක්වා යුගල පහ බැගින් දී ඇත.ඒවා අතුරින් එක් යුගලයක පද එකිනෙක හා නොගැලපේ.එම නොගැලපෙන පද යුගලය කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන් තුළ ලියන්න.

11) 1.සේනානායක සමුද්‍රය - අම්පාර
2.පරාක්‍රම සමුද්‍රය - පොළොන්නරුව
3.කලා වැව - අනුරාධපුරය
4.තබ්බෝව වැව - පුත්තලම
5.ඉරක්කාමම් වැව - මන්නාරම (……)

12) 1.පරවි සංදේශය - ශ්‍රී රාහුල හිමි
2.සද්ධර්මරත්නාවලිය - ධර්මසේන හිමි
3.බුත්සරණ - ගුරුළුගෝමී
4.යාල්පානවෛපවමාලෛ - මයිල්වාක්නාපුල්වාර්
5.රසවාහිනි - වේදේහ හිමි (……..)

13) 1.විජය - තම්බපණ්ණි
2.පණ්ඩුවාසදේව - ඌරාතොට
3.භද්දකච්චායනා - ගෝකණ්ණ
4.සංඝමිත්තා තෙරණිය - ජම්බුකෝලපට්ටන
5.හේමමාලා දන්තකුමරු - ලංකාපටුන (…….)

14) 1.වන නදී - යෝධ වැව
2.ගෝණ නදී - කලා වැව
3.ජජ්ජර නදී - මාගල්ල වැව
4. කදම්භ නදී - මහකනදරා වැව
5.ගාහල්ල නදී - සේනානායක සමුද්‍රය (……)

15) 1.ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා - වෙන්කට රංගම්මා
2.කාකවණ්ණ රජතුමා - විහාරමහා දේවි
3.කූටකණ්ණ තිස්ස රජතුමා - අනුලා දේවි
4.පළමුවන විජයබාහු රජතුමා - තිලෝක සුන්දරී
5.පළමුවන විමලධර්මසූරිය රජතුමා - කුසුමාසන දේවි (……)

අංක 16 – 20 දක්වා XහාY තීරුවල දක්වා ඇති තොරතුරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර ඇතුළත් අංකය තෝරා වරහන තුළ ලියන්න.

X Y

16) 1.මහාවංසය A උපතිස්ස හිමි
2.රසවාහිනිය B වීදාගම මෛත්‍රීය හිමි
3.ලෝවැඩ සඟරාව C මහානාම හිමි
4.පූජාවලිය D බුද්ධ පුත්‍ර හිමි
5.පාලි බෝධි වංශය E වේදේහ හිමි

1.CBEDA 2.CEBDA 3.CABDE 4.CEDAB 5.CADBE (…….)

X Y

17) 1.කොටවෙහෙර A දේවානම්පියතිස්ස රජතුමා
2.ථූපාරාමය B මහා පරාක්‍රමබාහු රජතුමා
3.අභයගිරිය C මහසෙන් රජතුමා
4.ජේතවනාරාමය D දුටුගැමුණු රජතුමා
5.රුවන්වැලි මහා සෑය E වලගම්බා රජතුමා

1.BAECD 2. BECDA 3.BAEDC 4.BCDEA 5.BDAEC (…….)

X Y

18) 1.කසීකාර ග්‍රාම A වළංසාදන්නන් විසූ ගම්
2.මණිකාර ග්‍රාම B ධීවරයන් විසූ ගම්
3.ගෝපාල ග්‍රාම C ගොපල්ලන් විසූ ගම්
4.කේවට්ට ග්‍රාම D ගොවියන් විසූ ගම්
5.කුම්භකාර ග්‍රාම E මැණික් ගැරූ අය විසූ ගම්

1.DECBA 2. DEBAC 3.DBCAE 4. DACEB 5.DEACB (……)

X Y

19) 1.පත්මාවතී පිරිවෙන A කැරගල
2.විජයබා පිරිවෙන B රයිගම
3.ශ්‍රී සාරානන්ද පිරිවෙන C පැපිලියාන
4.සුනේත්‍රා දේවි පිරිවෙන D තොටගමුව
5.ඉරුගල්කුලතිලක පිරිවෙන E දෙවිනුවර

1.ABCDE 2.ADBCE 3.BAEDC 4.BADEC 5.BDCEA (…….)

X Y

20) 1.පණ්ඩුකාභය රජු A දීඝජන්තු
2.වලගම්බා රජු B චන්ද්‍ර
3.දුටුගැමුණු රජු C නන්දිමිත්‍ර
4.ධාතුසේන රජු D කපිසීය
5.එළාර රජු E මිගාර

1.BDCEA 2.BCEDA 3. BECDA 4.BADEC 5.BCDEA (…….)

අංක 21 - 25 තෙක් නිවැරදි පිළිතුර තෝරා එහි අංකය තිත් ඉරි මත ලියන්න.

21) ශ්‍රී ලංකාවේ සිතියමක් නිර්මාණය කළ මුල්ම යුරෝපීය ජාතිකයා කවුද?
1.ඇරිස්ටෝටල් 2.මෙගස්තිනිස් 3.ටොලමි 4.ප්ලිනි 5.ස්ට්‍රාබෝ (……)

22) උඩරට රාජධානි සමයේ ලංකාවට පැමිණි ලන්දේසි දූත කණ්ඩායම ගොඩබට වරාය වන්නේ කුමක්ද?
1.මහාතිත්ථ 2.ගෝකණ්ණ 3.ගාල්ල 4.මඩකලපුව 5.දෙවුන්දර (……..)

23) උඩරට රාජධානි සමයේ දී ප්‍රවාහන කාර්යාංශය හඳුන්වන ලද්දේ කිනම් නමකින්ද?
1.කොට්ටල් බද්ද 2.බඩිගේ බද්ද 3.කුරුවේ බද්ද 4.මහ බද්ද 5.කින්නර බද්ද (……)

24) පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණෙන විට යාපනයේ පාලකයා කවුරුන්ද?
1.සංකිලි 2.වරෝදය 3.පරරාජසේකරම් 4.පුවිරාජ පණ්ඩරම් 5.විජය කුලංකෙයි (…….)

25) 1802 වන විට ලංකාවේ සිටි ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා කවරෙක්ද?
1.තෝමස් මේට්ලන්ඩ් 2.ටොරින්ටන් සාමි 3.ෆෙඩ්රික් නෝර්ත්
4.රොබට් බ්‍රවුන්රිග් 5. එමසන්ට් සාමි (……)

අංක 26 - 30 දක්වා මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් දක්වා ඇත.එම කරුණු අතුරින් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ.එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉරි මත ලියන්න.

26) පළමුවන පරාක්‍රමබාහු රජුගේ විදේශ සම්බන්ධතා
1.බුරුමය ආක්‍රමණය කිරීම
2.කාම්බෝජය සමඟ මිත්‍ර සම්බන්ධතා
3.චීනය සමඟ වෙළඳ සම්බන්ධතා
4.දකුණු ඉන්දියාවේ පාණ්ඩ්‍ය දේශය තුළ ආක්‍රමණය
5.අග්නිදිග ආසියාතික රටවල් සමඟ සම්බන්ධතා (……)

27) පොළොන්නරුවේ චෝල පාලනය
1.පොළොන්නරුව ජනනාථපුරම් ලෙස හඳුන්වන ලදී
2.ශ්‍රී ලංකාවේ චෝල බලය වර්ධනය වුයේ පස්වන මිහිඳු රජුගේ කාලයේ දීය.
3.ලංකාවේ උතුරු තොට මුම්මුඩි චෝල මංගලම් ලෙස හඳුන්වන ලදී.
4චෝල අධිරාජ්‍යයේ ප්‍රබලයන් දෙදෙනෙකු ලෙස පළවන රාජ රාජ චෝල,රාජේන්ද්‍රචෝල දැක්විය හැක.
5.චෝල පාලනයේ ශ්‍රේෂ්ඨතමයා වුයේ එළාර රජුය. (…….)

28) යාපනය රාජධානිය
1.යාපනය රාජ්‍යයේ පරපුර ආර්ය චක්‍රවර්තී පරපුරයි
2.යාපනයේ ආරම්භක පාලකයා වූයේ විජය කුලංකෙ රජුය
3.යාපනයේ අගනගරය නල්ලූර් වේ.
4.යාල්පාන වෛපවමාලෙයි යනු යාපනය පිළිබඳ හැදෑරීමට ඇති මූලාශ්‍රයයි.
5.පෘතුග්‍රීසින් ලංකාවට පැමිණෙන විට යාපනයේ පාලකයා වුයේ පරරාජසේකරම් රජුය. (…….)

29) නිශ්ශංකමල්ල රජු මුහුණ දුන් අභියෝග
1.චෝල ආක්‍රමණය
2.දේශීය ගොවිකුලයේ විරෝධතා
3.මහා පරාක්‍රමබාහු රජුගේ කීර්තිනාමය
4.නිශ්ශංකමල්ල කාලිංග වංශික බව
5.සිහසුනට පාණ්ඩ්‍ය වංශිකයින් උරුමකම් කියා පෑම (…….)

30) උඩරට නායක්කාර් වංශය
1.නායක්කාර් වංශයේ ආරම්භකයා ජයවීර බණ්ඩාර වේ.
2.නායක්කාර් වංශය වඩිග වංශය ලෙස හැඳින්වේ.
3.මෙහි අවසාන පාලකයා ශ්‍රී වික්‍රමරාජසිංහ රජුය.
4.නායක්කාර් වංශය ඉදිරියට ගෙන යන ලද්දේ කීර්ති ශ්‍රී රාජසිංහ රජුය.
5.නායක්කාර් වංශය ඉන්දියාවෙන් ලංකාවට ආ රාජවංශයකි. (…….)

අංක 31 - 35 දක්වා එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති යන ප්‍රතිචාර හතර අතුරින් එකක් හෝ කිහිපයක් නිවැරදිය.එම ප්‍රතිචාරය තෝරා,

AහාB නිවැරදි නම් අංක 01 ද
BහාC නිවැරදි නම් අංක 02 ද
BහාD නිවැරදි නම් අංක 03 ද
AහාC නිවැරදි නම් අංක 04 ද
ප්‍රතිචාර එකක් හෝ දෙකකට වඩා වැඩි නම් අංක 05 ද වරහන තුළ ලියන්න

31) මුටසීව රජතුමා සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදිවේද?
A ලංකාවේ මුල්ම පාලකයා වේ.
B වසර හැටක් ලංකාව පාලනය කරන ලදී.
C මෙතුමා ගේ කාලය සාමකාමී පාලන කාලයකි.
D මහමෙව්නා උයන ඉදිකරන ලදී (……..)

32) එළාර රාජ්‍ය සමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?
A මහාවංශයට අනුව එළාර රජතුමා සාධාරණ හා ධාර්මික පාලකයෙක් ලෙස සලකනු ලැබීය.
B එළාර රජතුමා වසර 44 ක් රජරට පාලනය කළේය.
C එළාර රජතුමා චෛතියගිරියෙහි ස්ථූපයක් කරවීය.
D හල්ලුක,එළාර රජුගේ සේනාධිපතියෙකු විය. (……..)

33) අනුරාධපුර යුගයේ විදේශ වෙළෙඳාම සම්බන්ධයෙන් පහත දක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?
A මහාතිත්ථ ප්‍රධාන වෙළෙඳ වරායක් විය.
B ශ්‍රී ලංකාව කපුපිළි නිර්යාත කළේය.
C ශ්‍රී ලංකාව හා දකුණු ඉන්දියාව අතර සමීප වෙළෙඳ සබඳතා පැවතිණි.
D වෙළෙඳ "චෙට්ටියාර්" වරුන් නමින් හැඳින්විණි. (…….)

34) 1වන විජයබාහු රජු සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?
A පොළොන්නරුවේ ප්‍රථම පාලකයාය.
B චෝල පාලනයෙන් රට නිදහස් කරගන්නා ලදී.
C 1 වන විජයබාහු රජතුමාගේ පියා වන්නේ 1 මානාභරණ රජතුමාය.
D මව් පාර්ශවය පාර්වති කාලිංග වංශයයි. (……)

35) කෝට්ටේ යුගය සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?
A හයවෙනි පරාක්‍රමබාහු රජු ශ්‍රේෂ්ඨතම පාලකයාය.
B සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගයයි.
C පූජාවලිය රචනා කරන ලද්දේ හයවෙනි පරාක්‍රමබාහු රජතුමාය.
D මයූර සංදේශය කෝට්ටේ යුගයේ රචනා කරන ලදී. (……..)

අංක 36 - 40 දක්වා ප්‍රශ්න වලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත.එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවේ දක්වෙන 1,2,3,4,5 යන ප්‍රකාශ අතරින් කවර ප්‍රකාශ යුගලයකටදැයි තෝරා ඊට අදාළ අංකය වරහන් තුළ ලියන්න.

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදිය | වැරදිය |
| 2 | නිවැරදිය | නිවැරදිය |
| 3 | වැරදිය | වැරදිය |
| 4 | වැරදිය | නිවැරදිය |
| 5 | නිවැරදිය | නිවැරදිවන අතර පළමුවැන්න මැනවින් පහදයි |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36) | මිහිඳු හිමියන් පිළිබඳ පළමුවන සියවසට අයත් මිහින්තලේ සෙල්ලිපිය මඟින් තොරතුරු අනාවරණයවේ. | මිහිඳු හිමියන් ලක්දිවට වැඩම කොට ලංකාවේ බුදු සසුන පිහිට වූ බවට තොරතුරු සෙල්ලිපි මඟින් අනාවරණය වේ. (……) |
| 37) | බදුලු ටැම්ලිපිය වෙළෙඳ ගමක පාලනය පිළිබඳ නිති රීති වාර්තා කරයි. | සත්මහල් ප්‍රසාදය නිශ්ශංකමල්ල රජතුමා විසින් කරවන ලදැයි විශ්වාස කෙරේ. (…….) |
| 38) | ලන්දේසින් රෝම ලන්දේසි නිතීය ලංකාවට හඳුන්වා දෙන ලදී. | ලන්දේසින් ලංකාවේ උසාවි පද්ධතියක් ආරම්භ කරන ලදී. (……..) |
| 39) | ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත් 1796 දී බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් බවට පත් විය. | ශ්‍රී ලංකාවේ 1948 දී එක්සත්ජාතින්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලබා ගත්තේය (..…..) |
| 40) | සර් ෆෙඩ් රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා විසින් රාජකාරි ක්‍රමය අහෝසි කරන ලදී. | තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයා විසින් එය නැවත ඇති කරන ලදී. (……) |

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

**දෙවන වාර ඇගයීම - 2025**
**Second Term Evaluation - 2025**

| | | | | |
|---|---|---|---|---|
| ශ්‍රේණිය Grade | 13 | විෂයය Subject | ලංකා ඉතිහාසය - 11 | |

නම/NAME:-.............................................................................................................

සැලකිය යුතුයි.

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රය වශයෙන් කොටස් තුනකි.යටත් පිරිසෙයින් එක් කොටසකින් එක් ප්‍රශ්නයක් තෝරාගත යුතුය..

## A කොටස

1) ඔබට සපයා ඇති ලංකා සිතියමෙහි පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කර නම් කරන්න.

1 කලා වැව   11. පොළොන්නරුව   111.සබරගමු පළාත   1V. කල්පිටිය
V.දඹකොළ පටුන   V1.නාච්චදූව වැව   V11.සේරුවිල   V111. උඩවලව ජලාශය
1X.ගොඩවාය   X. පොතාන   X1.මහනුවර   X11. මහියංගනය

(ලකුණු 12)

## B කොටස

2) අනුරාධපුර යුගයේ අවසානය දක්වා ඉතිහාසය හැදෑරීමේදී පාලිවංශ කථාවලින් අනගි පිටුවහලක් ලැබේ.

1.ලංකා ඉතිහාසය හැදෑරීමට ඇති අනුරාධපුර යුගයට අයත් මූලාශ්‍ර දෙකක් ලියන්න. (ලකුණු 2)

11මූලාශ්‍ර වලට අනුව ලංකා ඉතිහාසයේ අනුරාධපුර යුගයේ බලය ලබා ගත් මුල්ම පාලකයා හා අවසාන පාලකයා නම් කරන්න.(ලකුණු 02)

111.පාලි වංශකතාවලින් හෙළිවන ආකාරයට ලංකාවට එල්ලවූ මුල්ම ආක්‍රමණ දෙකක් ලියන්න. (ලකුණු 02 )

1V.ලාංකීය ඉතිහාසය හැදෑරීමට ඇති මහාවංශයේ වැදගත්කම හා අඩුපාඩු සමාලෝචනය කරන්න. (ලකුණු 10 )

3) පණ්ඩුකාභය රජතුමා ගේ දේශපාලන කාර්යභාරය සමාලෝචනය කරන්න. (ලකුණු 16 )

4) පොළොන්නරු යුගයේ අභියෝග රැසකට මුහුණ දුන් පාලකයා වන්නේ,කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජතුමාය.

1.නිශ්ශංකමල්ල රජු කුමන රාජ වංශයකට අයත්ද? (ලකුණු 02)

11.පොළොන්නරුවේ රාජ්‍යය මෙහෙය වූ ශ්‍රේෂ්ඨ පාලකයන් දෙදෙනෙකු නම් කරන්න .(ලකුණු 02)

111.නිශ්ශංකමල්ල රජතුමාගේ සංස්කෘතික සේවාව කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02 )

1V.නිශ්ශංකමල්ල රජතුමා මුහුණ දුන් අභියෝග සැකෙවින් දක්වා ඔහු ඒවා ජයගත් අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10 )

5) පහත සඳහන් මාතෘකා අතුරින් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

1.දීපවංශය
11.ප්‍රාග් ඓතිහාසික යුගය
111.අනුරාධපුර යුගයේ වාරි කර්මාන්ත
1V.කෝට්ටේ යුගයේ සාහිත්‍යය. (ලකුණු 8x2 = 16 )

C කොටස

6) පහත දැක්වෙන මාතෘකා වෙනවෙනම සමාලෝචනය කරන්න
   1.අනුරාධපුරයට එල්ලවූ විදේසිය ආක්‍රමණ
   11.අනුරාධපුර රාජධානියේ බිඳ වැටීම (ලකුණු 8 x 2 = 16)
7) දඹදෙණි යුගයේ සංස්කෘතික නවෝදයක් ඇති කරන ලද ශ්‍රේෂ්ඨ පාලකයා වන්නේ 11 පරාක්‍රමබාහු රජතුමාය.
   1. දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ ප්‍රධාන ඇමතියා නම් කරන්න. (ලකුණු 02)
   11.දෙවනපරාක්‍රමබාහු රජතුමා මුහුණ දුන් අභියෝග දෙකක් ලියන්න. (ලකුණු 02)
   111.දෙවනපරාක්‍රමබාහු රජතුමාගේ සංස්කෘතික නවෝදය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 )
   1V.දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ අභිමානය රදා පැවතියේ මෙරටට එල්ල වූ විදේශිය ආධිපත්‍යයෙන් රට මුදවා ගැනීම නිසාය.ඒ පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 10)
8) 16 වන සියවසේ ශ්‍රී ලංකාවේ දේශපාලන තත්වය සමාලෝචනය කරන්න. (ලකුණු 16 )
9) ක්‍රි.ව.1017 චෝළ ආක්‍රමණ එල්ල වීම සමඟ පොළොන්නරුව රාජධානිය බිහි විය.
   1.පොළොන්නරුව රාජධානිය පාලනය කළ ශ්‍රේෂ්ඨ පාලකයින් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02 )
   11.පොළොන්නරුව රාජධානිය හඳුන්වන ලද වෙනත් නම් දෙකක් ලියන්න. (ලකුණු 02)
   111.පොළොන්නරුව රාජධානියේ බලයට පත් වූ ශ්‍රේෂ්ඨ කාන්තාවන් දෙදෙනෙකුනම් කරන්න. (ලකුණු 02)
   1V.පොළොන්නරුව රාජධානියේ පරිහානිය හා බිඳ වැටීම පිළිබඳ සමාලෝචනය කරන්න. (ලකුණු 10 )



පළාත් මායිම
மாகாண எல்
Provincial Bounc